# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1465 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | /2024 |
| දිනය<br>திக<br>Date | 13/09/2024<br>පැය 1145 | | |

# මාධ්‍ය නිවේදනය

## 01. දුම්රිය අනතුරක් - රත්ගම පොලිස් වසම

2024.09.13 වන දින උදෑසන කාලයේ රත්ගම පොලිස් වසමේ විජේරත්න මාවත දුම්රිය හරස් මාර්ගයේදී මරදාන සිට බෙලිඅත්ත බලා ධාවනය වූ දුම්රියෙහි ත්‍රීරෝධ රථයක් ගැටී අනතුරක් සිදු ව ඇත.

අනතුරින් එක් පුද්ගලයෙකු එම ස්ථානයේ මියගොස් ඇති අතර රථයේ ගමන් ගමන් කල තවත් පුද්ගලයෙකු බරපතල තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කිරිමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 45 හා 55 පමණ වයස් වල පසුවන දොඩංදූව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අනතුර සිදු වූ ස්ථානයේදී මිය ගිය පුද්ගලයාගේ මෘතශරිරය බූස්ස දුම්රිය ස්ථානයට භාර දී ඇත. සිද්ධිය සම්බන්ධයෙන් රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - මාලඹේ පොලිස් වසම.

2024.09.13 වන දින අළුයම් කාලයේ මාලඹේ පොලිස් වසමේ හෝකන්දර ප්‍රදේශයේදී අතුරුගිරිය දෙස සිට මාලඹේ දෙසට ගමන් ගත් ජීප් රථයක් එම දිසාවටම ඉදිරියෙන් ගමන් කල පාපැදියක ගැටිමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පාපැදිකරු ඔරුවල රෝහලට ඇතුලත් කිරිමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ උඩුමුල්ල, මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඔරුවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ජීප් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මාලබේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. තල්මත්‍යසයෙකුගේ අම්බර් සන්තකයේ තබා ගත් සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - හොරණ පොලිස් වසම

2024.09.12 වන දින සවස් කාලයේ හොරණ පොලිස් වසමේ මීවනපලාන ප්‍රදේශයේ නිවසකදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර තල්මත්‍යසයෙකුගේ අම්බර් කිලෝ ග්‍රෑම් 05 යි ග්‍රෑම් 620 ක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වූ බෙල්ලන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**